# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අ.පො.ස.(උ.පෙ) විභාගය-2018 අගෝස්තු

## 52-නර්තනය (දේශිය) -1 පත්‍රය

කාලය පැය 02යි.
වරණ 5න් යුත් බහුවරණ ප්‍රශ්න 25ක් හා කෙටි පිළිතුරු සැපයිමේ ප්‍රශ්න 25කි.
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ප්‍රශ්න 50 කි. (50 ×2) මුළු ලකුණු 100කි.

## 52 නර්තනය(දේශිය) - 11 පත්‍රය.

කාලය පැය 03යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් හතරකින් සමන්විතය.

1 කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 03කි.
ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

11 කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02කි.
එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.

111 කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02කි.
එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.

1v කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02කි.
එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.

| | |
|---|---|
| පළමු පත්‍රය ( ප්‍රශ්න 50×2) ලකුණු | 100 |
| දෙවන පත්‍රය සඳහා (20×5) ලකුණු | 100 |
| 1 සහ11 පත්‍ර සඳහා 100+100 ලකුණු | 200 / 2 |
| අවසාන ලකුණු | 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..................................................
..................................................  ✓  △ $\frac{4}{5}$
..................................................

(ii) ..................................................
..................................................  ✓  △ $\frac{3}{5}$
..................................................

(iii) ..................................................
..................................................  ✓  △ $\frac{3}{5}$
..................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + $\frac{3}{5}$ (iii) = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

<u>අභිමතාර්ථ.</u>

**නර්තන විෂය නිර්දේශයට අදාළ /ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ/ න්‍යායාත්මක හා ප්‍රායෝගික විෂය අන්තර්ගතයේ නිපුණතා සාක්ෂාත් කර ගැනිම.**

- නර්තන කලාවේ විකාශනය පිළිබඳ ඓතිහාසික දැනුම මැන බැලීම.
- දේශීය නර්තන කලාව හා බැඳි සංස්කෘතික පසුබිම පිළිබඳ දැනුම මැන බැලීම.
- ජන නැටුම් පිළිබඳ අවබෝධය ලබා ගැනිම.
- ප්‍රස්තාරකරණය පිළිබඳ දැනුම,අවබෝධය භාවිතය හා හැකියාව ඇගයිමට ලක් කිරිම
- විෂය ක්ෂේත්‍රයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දැනුම,අවබෝධය හා භාවිතය විචාරය කිරිමේ හැකියාව ලබා ගැනිම.
- නිර්මාණාත්මක චින්තනය හා කුසලතා හඳුනා ගෙන සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව ලබා ගැනිම.
- සන්නිවේදන මාධ්‍ය පිළිබඳ හඳුනා ගෙන ඒවායෙහි ගුණාත්මක බව රස වින්දන හැකියාව ඇගයිමට ලක් කිරිම පිළිබඳ හැකියාව ලබා ගැනිම.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.08/ 0830 - 1030

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 12 | |
| 03 | 13 - 20 | |
| 04 | 21 - 25 | |
| 05 | 26 - 37 | |
| 06 | 38 - 46 | |
| 07 | 47 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

● අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** 'උඩරට තාල ශාස්ත්‍රය' සහ 'හෙළ ගී මග' කෘති රචනා කරන ලද්දේ,
(1) මුදියන්සේ දිසානායක සහ සරත් විජේවර්ධන ය.
(2) මුදියන්සේ දිසානායක සහ වින්ස්ටන් සෝමපාල ය.
(3) ජේ. ඊ. සේදරමන් සහ ඩබ්ලිව්. බී. මකුලොලුව ය.
(4) ජේ. ඊ. සේදරමන් සහ තිස්ස කාරියවසම් ය.
(5) ජේ. ඊ. ගුණසේන සහ කේ. ඇස්. ප්‍රනාන්දු ය. (.........)

**2.** උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් ඇඳුම්වල කොටස් අනුපිළිවෙළින්,
(1) අවුල්හැරය, වාහළ හැට්ටය සහ සගල ලනුවයි.
(2) අවුල්හැරය, තෙල්මේ හැට්ටය සහ පබළු හැට්ටයයි.
(3) අවුල්හැරය, තෙල්මේ හැට්ටය සහ බුබුළු පටියයි.
(4) පායිම්පත, ඉන හැඩය සහ උල්උඩයයි.
(5) පායිම්පත, දෙවල්ල සහ පබළු හැට්ටයයි. (.........)

**3.** කොහොඹා කංකාරියේ ගායනය සහිත ප්‍රධාන නර්තනාංග ලෙස සැලකෙන්නේ,
(1) යක්තුන් පදය, යක් ඇනුම සහ ආවැන්දුම ය.
(2) යක්තුන් පදය, යක් ඇනුම සහ කෝල්පාඩුව ය.
(3) අස්නේ, යක් ඇනුම සහ දුනුමාලප්පුව ය.
(4) අස්නේ, කොහොඹා හැල්ල සහ මඩුපුරය ය.
(5) අස්නේ, කොහොඹා හැල්ල සහ ගබඩා කොල්ලය ය. (.........)


[දෙවැනි පිටුව බලන්න

4. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලයට අයත් කොටස් වන්නේ,
(1) හේලය, පබළු හැට්ටය සහ කරකැල්ලයි. (2) හේලය, පබළු හැට්ටය සහ දෙවුරමාලයයි.
(3) හේලය, බුබුළු පටිය සහ කයිමෙත්තයි. (4) රතු රෙද්ද, රතු හැට්ටය සහ වෙස් තට්ටුවයි.
(5) රතු රෙද්ද, රතු හැට්ටය සහ උල්උඩයයි. (………)

5. දෙවොල් මඩු ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරුන් ලෙස සැලකෙන්නේ,
(1) පත්තිනි, දෙවොල් හා වාහළ දෙවිවරුන් ය.
(2) පත්තිනි, ගම්භාර හා කොහොඹා දෙවිවරුන් ය.
(3) පත්තිනි, දෙවොල් හා කොහොඹා දෙවිවරුන් ය.
(4) දෙවොල්, කතරගම හා වීරමුණ්ඩ දෙවිවරුන් ය.
(5) දෙවොල්, වාහළ හා වීරමුණ්ඩ දෙවිවරුන් ය. (………)

6. දේශීය තාල පද්ධතියෙහි මාත්‍රා තුනේ (3) ගති ලක්ෂණයට සමාන වන කර්ණාටක තාල පද්ධතිය වන්නේ,
(1) සංකීර්ණ ජාති වේ. (2) ඛණ්ඩ ජාති වේ.
(3) ඛණ්ඩ චාපු වේ. (4) මිශ්‍ර චාපු වේ.
(5) තිශ්‍ර චාපු වේ. (………)

7. මෙම රූපයෙන් දැක්වෙන්නේ,
(1) සන්නියකුම් රංග භූමියකි.
(2) කෝලම් නාටක රංග භූමියකි.
(3) කෝහොඹා කංකාරි රංග භූමියකි.
(4) දෙවොල් මඩු රංග භූමියකි.
(5) නාඩගම් රංග භූමියකි.



(………)

8. දේවාලවල සේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නලඟනන් පිළිබඳ සඳහන් වන්නේ,
(1) සිංහල නර්තන කලාව ග්‍රන්ථයේ ය. (2) එදා හෙළදිව ග්‍රන්ථයේ ය.
(3) සිංහල ගැමි නාටකය ග්‍රන්ථයේ ය. (4) පරෙවි සංදේශයේ ය.
(5) සැළලිහිණි සංදේශයේ ය. (………)

9. 2005 වර්ෂයේ දී සෞන්දර්ය අධ්‍යයන ආයතනය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය වූයේ,
(1) කැලණිය විශ්වවිද්‍යාලය නමිනි. (2) කොළඹ විශ්වවිද්‍යාලය නමිනි.
(3) සෞන්දර්ය විශ්වවිද්‍යාලය නමිනි. (4) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමිනි.
(5) සෞන්දර්ය අධ්‍යයන විශ්වවිද්‍යාලය නමිනි. (………)

10. නර්තනයේ අවකාශ භාවිතය පිළිබඳ මූලධර්ම වන්නේ,
(1) දිසා, රටා හා මෝස්තර ය. (2) දිසා, රටා හා වර්ණ ය.
(3) දිසා, රටා හා වස්ත්‍රාභරණ ය. (4) රිද්මය, වර්ණය සහ හැඩතල ය.
(5) රිද්මය, වර්ණය සහ අලංකාරය ය. (………)

11. බැලේ නර්තනය සඳහා මුල් යුගයේ යොදා ගත් ගවුම කුමක් ද?
(1) ක්ලැසික් ටුටූ (2) බෙලැසිස් ටුටූ
(3) රොමැන්ටික් ටුටූ (4) රොමැන්ටික් ක්ලැසික් ටුටූ
(5) ස්කල්ෆෝ (………)

12. භරත නාට්‍යම් සම්ප්‍රදායේ සහ මනිපුරි නර්තන සම්ප්‍රදායේ හිසට පළඳිනු ලබන ආභරණ වන්නේ,
(1) ජිමික්කි සහ රිෂම්පුරිට් ය. (2) ජිමික්කි සහ කුමින් ය.
(3) රාක්කුඩි සහ පොෂ්වාන් ය. (4) රාක්කුඩි සහ කොක්කුම්බි ය.
(5) කොක්කුම්බි සහ මකුට ය. (………)

[තුන්වැනි පිටුව බලන්න.

**13.** "සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝ මුල විදුරා සන" මෙහි
(1) සඳැස්මත් 18, ලඝු මාත්‍රා 12, ගුරු මාත්‍රා 04 කි.
(2) සඳැස්මත් 18, ලඝු මාත්‍රා 14, ගුරු මාත්‍රා 04 කි.
(3) සඳැස්මත් 20, ලඝු මාත්‍රා 14, ගුරු මාත්‍රා 03 කි.
(4) සඳැස්මත් 20, ලඝු මාත්‍රා 16, ගුරු මාත්‍රා 03 කි.
(5) සඳැස්මත් 20, ලඝු මාත්‍රා 18, ගුරු මාත්‍රා 03 කි. (.........)

**14.** පහත ඡායාරූපයෙන් දැක්වෙන දේශීය මුද්‍රා නාට්‍යය කුමක් ද?



(1) හංසවිල
(2) නල දමයන්ති
(3) සැළලිහිණිය
(4) මිය ගිය හංසයා
(5) දියවන්නාව (.........)

**15.** රස භාව පිළිබඳ අදහස් දැක්වූ පෙරදිග මතවාදීන් වන්නේ,
(1) භරතමුනි සහ ඇරිස්ටෝටල් ය.
(2) භරතමුනි සහ ධනංජය ය.
(3) නන්දිකේශ්වර සහ ප්ලේටෝ ය.
(4) අභිනවගුප්ත සහ ඇරිස්ටෝටල් ය.
(5) අභිනවගුප්ත සහ ප්ලේටෝ ය. (.........)

**16.** ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම් කලාව අයත් යුගය කුමක් ද?
(1) මහනුවර
(2) අනුරාධපුර
(3) පොළොන්නරු
(4) ගම්පොළ
(5) කුරුණෑගල (.........)

**17.** දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් 500ක් පමණ ගී ගයා නර්තනය කළ බව සඳහන් වන්නේ,
(1) ඉබන් බතුතාගේ වාර්තාවේ ය.
(2) රොබට් නොක්ස්ගේ වාර්තාවේ ය.
(3) පාහියන්ගේ වාර්තාවේ ය.
(4) ස්පිල් බර්ජන්ගේ වාර්තාවේ ය.
(5) ජෝර්ජ් කීට්ගේ වාර්තාවේ ය. (.........)

**18.** "නිතිනි දන මන නයන පිනවන දූල් සිරින් දෙවඟනක විලසා" මෙම සවුදම ගයන්නේ,
(1) පාර්වතී දෙවඟනට ය.
(2) දුර්ගා දෙවඟනට ය.
(3) ලක්ෂ්මී දෙවඟනට ය.
(4) සරස්වතී දෙවඟනට ය.
(5) පත්තිනි දෙවඟනට ය. (.........)

**19.** පක්වාජ් සහ තබ්ලාව වාදනය කරනු ලබන්නේ කුමන භාරතීය නර්තන සම්ප්‍රදායට ද?
(1) දක්ෂිණ භාරතීය භරත නර්තනයට ය.
(2) දක්ෂිණ භාරතීය කථකලි නර්තනයට ය.
(3) දක්ෂිණ භාරතීය කුච්චිපුඩි නර්තනයට ය.
(4) උත්තර භාරතීය කථක් නර්තනයට ය.
(5) උත්තර භාරතීය මනිපුරි නර්තනයට ය. (.........)

**20.** මනිපුරි නර්තනයේ රාධාගේ චරිතය සඳහා යොදා ගන්නා රංගවස්ත්‍රාභරණ වන්නේ,
(1) රිෂම්පුරිට්, ධෝතිය සහ කිරීටම් ය.
(2) රිෂම්පුරිට්, ධෝතිය සහ පොෂ්වාන් ය.
(3) රිෂම්පුරිට්, කුමින් සහ චූරා ය.
(4) රිෂම්පුරිට්, කුමින් සහ පොෂ්වාන් ය.
(5) රිෂම්පුරිට්, චූරා සහ පොෂ්වාන් ය. (.........)

[ගතරවැනි පිටුව බලන්න.

**21.** කොහොඹා කංකාරියේ දී පුද ලබන දෙවිවරු ලෙස සැලකෙන්නේ,
(1) අලුත් කොහොඹා, පරණ කොහොඹා සහ කොට යකුන් ය.
(2) අලුත් කොහොඹා, මහ කොහොඹා සහ සූනියම් යකුන් ය.
(3) කොහොඹා තුන් කට්ටුව, බණ්ඩාර දෙවි හැටහත් කට්ටුව සහ වැදි යකුන් ය.
(4) කොහොඹා තුන් කට්ටුව, බණ්ඩාර දෙවි හැටහත් කට්ටුව සහ දෙවොල් යකුන් ය.
(5) කොහොඹා හැටහත් කට්ටුව, බණ්ඩාර දෙවි හැටහත් කට්ටුව සහ කඩවර යකුන් ය. (.........)

**22.** පහන් මඩුවේ නාට්‍යමය අවස්ථා ලෙස දැක්වෙන්නේ,
(1) අසුර යක්කම, පොත්කඩේ යක්කම හා රාමා මැරීම ය.
(2) අසුර යක්කම, පොත්කඩේ යක්කම හා මරා ඉපැද්දීම ය.
(3) අසුර යක්කම, පොත්කඩේ යක්කම හා පලවැල දානය ය.
(4) පොත්කඩේ යක්කම, අයිලේ යක්කම හා පලවැල දානය ය.
(5) පොත්කඩේ යක්කම, අයිලේ යක්කම හා නයා යක්කම ය. (.........)

**23.** පහත ඡායාරූපයෙන් දැක්වෙන්නේ කොහොඹා කංකාරියෙහි සුවිශේෂ වාදන අවස්ථාවකි.



එම වාදන අවස්ථාවෙන් දැක්වෙන්නේ,
(1) පූජා හේවිසි වාදනයයි.
(2) තේවා වාදනයයි.
(3) ගැට බෙර වාදනයයි.
(4) මගුල් බෙර වාදනයයි.
(5) අත්‍යබෙර වාදනයයි. (.........)

**24.** ද්‍රවිඩ-සිංහල සංස්කෘතිය හා බැඳි සමාන ගැමි නැටුම් මොනවා ද?
(1) කෝලාට්ටම් - ලී, සුලකු - කළ
(2) කෝලාට්ටම් - ලී, සුලකු - කුලු
(3) කෝලාට්ටම් - කුලු, සුලකු - ලී
(4) චෙම්බු - කළ, අරුවිවෙට්ටු - ලී
(5) චෙම්බු - කළ, අරුවිවෙට්ටු - කුලු (.........)

**25.** ශිවරංග සහ තිත්ත බත යන මුද්‍රා නාටක නිර්මාණය කළ ශිල්පීන් වන්නේ,
(1) චිත්‍රසේන ඩයස් සහ ප්‍රේමකුමාර එපිටවෙල ය.
(2) චිත්‍රසේන ඩයස් සහ ශේෂා පලිහක්කාර ය.
(3) චිත්‍රසේන ඩයස් සහ වසන්ත කුමාර ය.
(4) වසන්ත කුමාර සහ ප්‍රේමකුමාර එපිටවෙල ය.
(5) ප්‍රේමකුමාර එපිටවෙල සහ වසන්ත කුමාර ය. (.........)

[ඉන්වැනි පිටුව බලන්න

● අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

**26.** දීපංකර බුදුන් සමයේ බොරු කීමේ වරදට එහි විපාක විඳි බවට සන්නියකුමේ.................................... කතාවෙන් පෙන්වා දෙයි.

**27.** "නාද අසමින්නේ - ඇද පා තබමින්නේ" යනුවෙන් කෝලම්වල ................................................ චරිතය සබයට හඳුන්වා දෙයි.

**28.** තිත පිළිබඳ විග්‍රහ කිරීමේ දී පැරණි ක්‍රමය අනුව අඩ තිත ................................................ තිත හා තාල තිත යනුවෙන් ප්‍රධාන කොටස්වලට බෙදා වෙන් කර ඇත.

**29.** අනිලා, මණ්ඩුක සහ විරාඩි යන වන්නම් අයත් වන්නේ ................................................ නර්තන සම්ප්‍රදායට ය.

**30.** ක්‍රෝධ නැමැති ස්ථායි භාවයෙන් උපදින්නේ ........................................ රසයයි.

**31.** ඩෙප්පු යනු ................................................ නර්තන සම්ප්‍රදාය හා බැඳි අංග රචනා විධියකි.

**32.** කවි පාදයක ඇති ලඝු ගුරු මාත්‍රාවල එකතුව ................................... නම් වේ.

**33.** "ධා ධී නා - ධා තු නා" යන හින්දුස්ථානී තාලය, දේශීය තාල පද්ධතියෙහි ........................................ තනි තිතට සමාන ය.

**34.** වඩිග පටුන නර්තනය සිදු කරනු ලබන්නේ ........................................ ශාන්තිකර්මයේ දී ය.

**35.** වලයම භාවිතයට ගැනෙන්නේ ........................................ කොටසක් ලෙසිනි.

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර **තිත් ඉර** මත ලියන්න.

**36.** මෙම ඡායාරූපයෙන් දැක්වෙන නර්තන අංගය සහ එය අයත් ශාන්තිකර්මය කුමක් ද?

(i) නර්තන අංගය: ........................................................

(ii) ශාන්තිකර්මය :........................................................



**37.** ජතිස්වරම් සහ වර්ණම් යන නර්තන අංගවල නෘත්ත, නෘත්‍ය ලක්ෂණ ලියා දක්වන්න.

(i) ජතිස්වරම් : ........................................................

(ii) වර්ණම් :........................................................

[හයවැනි පිටුව බලන්න

38. 'කච්ච කෙට්ට' අභ්‍යාසම්වලට හා 'තත්කාර්' අභ්‍යාසවලට මූලික වන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

(i) කච්ච කෙට්ට: ……………………………………

(ii) තත්කාර් :……………………………………

39. මල් මඩුපුරය සහ ගුරුගේ මාලාව අයත් වන්නේ කුමන නර්තන සම්ප්‍රදායවලට ද?

(i) මල් මඩුපුරය: ……………………………………

(ii) ගුරුගේ මාලාව :……………………………………

40. ක්‍රිෂ්ණ ලීලා සහ ධරනි යන භාරතීය නෘත්‍ය නාටක නිර්මාණයට දායක වූ ශිල්පීන් **දෙදෙනා** කවුරුන් ද?

(i) ක්‍රිෂ්ණ ලීලා: ……………………………………

(ii) ධරනි :……………………………………

41. කපුයක්කාරිය සහ අභිමාන යකා රංගනය කෙරෙන ශාන්තිකර්ම **දෙක** නම් කරන්න.

(i) කපුයක්කාරිය: ……………………………………

(ii) අභිමාන යකා :……………………………………

42. ආචාර්ය එස්. පණිභාරත රජයේ ලලිත කලායතනයේ දැරූ තනතුර හා නිර්මාණය කළ ගැමි නැටුම කුමක් ද?

(i) දැරූ තනතුර: ……………………………………

(ii) ගැමි නැටුම :……………………………………

43. ගත් නිකාස් සහ රාස් නර්තන අංග අයත්වන නර්තන සම්ප්‍රදායන් **දෙක** නම් කරන්න.

(i) ගත් නිකාස්: ……………………………………

(ii) රාස් නර්තන :……………………………………

44. කුමාර පෙළපාළිය සහ මුදුන් තාලය යන නර්තන අංග දැකිය හැක්කේ කුමන ශාන්තිකර්මවල ද?

(i) කුමාර පෙළපාළිය: ……………………………………

(ii) මුදුන් තාලය :……………………………………

45. රුසියාවේ බැලේ රංග කලාව වර්ධනය කිරීමට දායක වූ රජු සහ එහි සුප්‍රසිද්ධ රඟහල කුමක් ද?

(i) රජු: ……………………………………

(ii) රඟහල :……………………………………

46. ප්‍රාසංගික නර්තන කලා නිර්මාණ වැඩි ප්‍රේක්ෂක පිරිසකට සන්නිවේදනය කළ ප්‍රධාන මාධ්‍ය **දෙක** නම් කරන්න.

(i) ……………………………………

(ii) ……………………………………

[හත්වැනි පිටුව බලන්න

**47.** භරත නාට්‍යම් සම්ප්‍රදාය හා මනිපුරි නර්තන සම්ප්‍රදාය උගන්වන ප්‍රධාන අධ්‍යාපන ආයතන **දෙක** සඳහන් කරන්න.

(i) භරත නාට්‍යම්:..........................................................................................

(ii) මනිපූරි:..........................................................................................

**48.** තිත් තාල සහිත හා තිත් තාල රහිත බව කවි පද ගායනයේ දී හඳුන්වන නාම ලියා දක්වන්න.

(i) තිත් තාල සහිත:..........................................................................

(ii) තිත් තාල රහිත:..........................................................................

**49.** හත් අඩියේ කවි සහ හිං හතරේ කවි අන්තර්ගත වන ශාන්තිකර්ම මොනවා ද?

(i) හත් අඩිය:..........................................................................

(ii) හිං හතර :..........................................................................

**50.** 'වනාන්තරයේ ඇවිදින කුමාරයෙකු වෙහෙසට පත්ව වැවක් අසල නතර වෙයි. ඔහු පිපාසය සංසිඳුවා ගැනීමට වැවට බසින විටම දිය රකුසෙකු ජලයෙන් මතු වෙයි. කුමාරයා මහත්සේ බියට පත්වෙයි.'
මෙයින් උද්දීපනය වන භාවය හා රසය නම් කරන්න.

(i) භාවය: ......................................................

(ii) රසය :......................................................

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

2018.08.09 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **I** වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II, III, IV** කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද **(ii)** කොටසට ලකුණු **06** ක් ද **(iii)** කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(අ) "තෙහිං තකු// තෙහිං ජිං ගත් තත් ජිං තරිකිට"

(ආ) "දිත්තම් දිතකු දොම් දොම් තා"

(ඇ) "ජිමිත් තක්කිට තකට ජිමිතකු"

(ii) පහත සඳහන් කවි පද මාත්‍රා තුනේ, තනි තිතට ප්‍රස්තාර කරන්න.

"පෙර බුදු මඟුලට ගෙනා උඩැක්කිය
ඒ බුදු මඟුලට ගැසූ උඩැක්කිය"

(iii) උදාර වන්නමේ අඩව්ව හෝ තුන් තාලයේ ඉරට්ටිය හෝ යක් පද මාත්‍රයේ කලාසම ප්‍රස්තාර කරන්න.

**2.** "ශාන්තිකර්මවල ගායනය, වාදනය පමණක් නොව එහි සැරසිලි මෙන්ම රංගවස්ත්‍රාභරණ ද සුසංයෝග වේ"

(i) පහන් මඩුවේ හෝ දෙවොල් මඩුවේ හෝ නර්තනාංග **දෙකක්** හඳුන්වා දී ඒ පිළිබඳ විමසුමක් කරන්න.

(ii) කොහොඹා කංකාරියේ, ගායනය සහිත සහ ගායනය රහිත නර්තන අංගය බැගින් ගෙන ඒවායේ විශේෂතා විග්‍රහ කරන්න.

(iii) සන්නියකුමේ එන සන්නි හා පාළි රංගනවල රංගවස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න.

**3.** (i) බලි ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණ පැහැදිලි කර එහි ගායනාවල සුවිශේෂතා පිරික්සන්න.

(ii) නර්තන කලාවේ ආරම්භයට ප්‍රාථමික මානව සමාජ පසුබිම බලපෑ ආකාරය පෙන්වා දෙන්න.

(iii) ආගමික හා සමාජයීය අවශ්‍යතා සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කර ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

## II කොටස

**4.** දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට විවිධ ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම වැදගත් වේ.

(i) අනුරාධපුර යුගයේ පැවැති බෞද්ධාගමික පුද පූජා නර්තන කලාව පෝෂණයවීමට දායක වූ ආකාරය සාධක **තුනක්** ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ii) කවිකාර මඩුව, නැටුම් ඉලංගම හා පෙරහර පැවැත්වීම සඳහා මහනුවර යුගයේ රජවරුන්ගෙන් සිදු වූ සේවාව කරුණු **තුනක්** යටතේ විග්‍රහ කරන්න.

(iii) 20 වන සියවසේ නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් **දෙදෙනෙකුගේ** නර්තන නිර්මාණ සහ කලා කෘති පිළිබඳ අගයන්න.

[දෙවැනි පිටුව බලන්න.

5. (i) සම්ප්‍රදායික කවි හා ජන කවිවල සමානතා අසමානතා පෙන්වා දෙන්න.

(ii) රබන් කවියක් හෝ පන්තේරු කවියක් හෝ ගෙන එහි අන්තර්ගත තොරතුරු විමසුමට ලක් කරන්න.

(iii) කෝලම් හා සොකරි නාටකවලින් එක් චරිතය බැගින් තෝරාගෙන එම චරිතවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් කරන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) | (ආ) | (ඉ) |
|---|---|---|
| පොණ්වාන් | තිල්ලානා | මීනාක්ෂි සුන්දරම්පිල්ලේ |
| ලෙහෙඟා | බ්‍රින්දාවන් පරේං | රබීන්ද්‍රනාත් තාගෝර් |
| ඔට්ටියානම් | තරානා | බ්‍රිර්ජු මහරාජ් |
| ඝඟ්රි | කාලි ශාස්ත්‍රම් | වල්ලතෝල් නාරායන් මෙනන් |

(i) (අ) කොටසේ සඳහන් කථකලි නර්තන සම්ප්‍රදායේ රංගවස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.

(ii) (ආ) කොටසේ සඳහන් භරත නාට්‍යම් නර්තන අංගය තෝරා, එම නර්තනයේ විශේෂතා සාකච්ඡා කරන්න.

(iii) (ඉ) කොටසේ සඳහන් අය අතුරෙන් ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රගමනයට දායක වූ ප්‍රවීණ කලාකරු නම්කර, ඔහුගෙන් ඉටු වූ සේවය පිළිබඳ ඇගයීමක් කරන්න.

7. (i) දේශීය ජන ජීවිතය ඉස්මතු කිරීම සඳහා කරදිය මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරු විසින් කරන ලද උත්සාහය එම මුද්‍රා නාට්‍යය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ii) ප්‍රංශයේ බැලේ නාට්‍ය ප්‍රවර්ධනය වූ ආකාරය විමසුමට ලක් කරන්න.

(iii) මාර්තා ග්‍රැහැම්, ඉසඩෝරා ඩන්කන්, ජීන් ජෝර්ජ් නෝවැර්, මයිකල් ෆෝකින්ස් යන ශිල්පීන් අතුරෙන් **දෙදෙනකු** පිළිබඳ අගයන්න.

## IV කොටස

8. අද්‍යතන නර්තනයේ ප්‍රාසංගික බව මතු කිරීමට භාරතීය මෙන්ම බටහිර සංගීතයේ උපයෝගීතාව වඩාත් ප්‍රබල වී තිබේ.

(i) අද්‍යතන ප්‍රසංග නර්තනය සඳහා යොදා ගන්නා සංචලනවල ඖචිත්‍ය බව විග්‍රහ කරන්න.

(ii) ගීත නර්තන නිර්මාණකරණයට සංගීතයෙන් ලැබෙන පිටිවහල විග්‍රහ කරන්න.

(iii) ප්‍රාසංගික නර්තනයේ රංගවස්ත්‍රාභරණ භාවිතය පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ විචාරයක් කරන්න.

* සාම්ප්‍රදායික ලක්ෂණ
* නිර්මාණාත්මක ලක්ෂණ
* බටහිර ආභාෂය
* භාරතීය ආභාෂය

9. (i) රංග රචනය සහ චිත්‍ර සම්පිණ්ඩනය අතර සහසම්බන්ධතාව විස්තර කරන්න.

(ii) රූපවාහිනිය මගින් ඉදිරිපත් කෙරෙන නර්තන වැඩසටහන්, රසඥතා වර්ධනයට කෙසේ බලපාන්නේ දැයි විචාරය කරන්න.

(iii) සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි රංග ආභරණ ආකෘතියක් නිර්මාණය කර ගන්නා ආකාරය විමසන්න.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂය අංකය / பாட இலக்கம்: 52

විෂයය / பாடம்: නර්තනය (දේශීය)

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 3 |
| 02. | 2 | 12. | 5 | 22. | 1 |
| 03. | 4 | 13. | 3 | 23. | 5 |
| 04. | 1 | 14. | 2 | 24. | 2 |
| 05. | 1 | 15. | 2 | 25. | 1 |
| 06. | 5 | 16. | 4 | | |
| 07. | 2 | 17. | 1 | | |
| 08. | 2 | 18. | 5 | | |
| 09. | 4 | 19. | 4 | | |
| 10. | 1 | 20. | 4 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50

| | | |
|---|---|---|
| 26. | දං උදි | |
| 27. | ජස / පේඩිරාළ | |
| 28. | මධ්‍ය | |
| 29. | සබරගමු | |
| 30. | රෞද්‍ර | |
| 31. | කථකලි | |
| 32. | සදෘස්මත් | |
| 33. | මැදුම් (මාත්‍රා 3) | |
| 34. | සූනියම් | |
| 35. | උඩැක්කිය | |
| 36. | කොර සන්නිය | දහඅට සන්නිය / සන්නියකුම |
| 37. | නෘත්ත | නෘත්‍ය |
| 38. | කථකලි | කථක් |
| 39. | සබරගමු | උඩරට |
| 40. | ශ්‍රීමති මේනකා | රාම්ගෝපාල් |
| 41. | රට යකුම /රිදී යාගය | සන්නි යකුම / දහඅට සන්නිය |
| 42. | විදුහල්පති | ගොයම් කැපීම |
| 43. | කථක් | මණිපුරි |
| 44. | සන්නි යකුම/දහඅට සන්නිය | පහන්මඩුව |
| 45. | මහා පීටර් | බොල්ෂෝයි |
| 46. | රූපවාහිනිය | අන්තර්ජාලය |
| 47. | කලා ක්ෂේත්‍ර | ශාන්ති නිකේතනය/විශ්වභාරති විශ්වවිද්‍යාලය |
| 48. | ආසාතාත්මත | අනාසාතාත්මක |
| 49. | සූනියම් ශාන්තිකර්මය | බලි ශාන්තිකර්මය |
| 50. | භය | භයානක |

# නර්තනය - (දේශීය) 11

## 1 කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන ප්‍රස්තාර කරන්න.
   (අ). "තෙහිං තකු // තෙහිං ජිං ගත් තත් ජිං තරිකිට"
   (ආ). "දිත්තම් දිතකු දොම් දොම් තා"
   (ඇ). "ජිමිත් තක්කිට තකට ජිමිතකු"

උඩරට සම්ප්‍රදාය.

| ^ | ^ | / | ^ | ^ | / |
|---|---|---|---|---|---|
| 1 2 | 1 2 | 1 2 3 | 1 2 | 1 2 | 1 2 3 |
| තෙහිං තකු | තෙහිං තකු | තෙහිං ජිං - | ගත් - | තත් - | ජිං තරි කිට |

පහතරට සම්ප්‍රදාය.

| ^ | ^ | / | ^ | ^ | / |
|---|---|---|---|---|---|
| 1 2 | 1 2 | 1 2 3 | 1 2 | 1 2 | 1 2 3 |
| දිත් - | තම් - | දි ත කු | දොම් - | දොම් - | තා |

සබරගමු සම්ප්‍රදාය

| / | ∧ | ∧ | / | ∧ | ∧ |
|---|---|---|---|---|---|
| 1 2 3 | 1 2 | 1 2 | 1 2 3 | 1 2 | 1 2 |
| ජි මිත් - | තත් - | කි ට | ත ක ට | ජි මි | ත කු |

*නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට / ලකුණු 02*
*බෙර පද නිවරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) පහත සඳහන් කවි පද මාත්‍රා තුනේ තනි තිතට ප්‍රස්තාර කරන්න.
"පෙර බුදු මඟුලට ගෙනා උඩැක්කිය ඒ බුදු මඟුලට ගැසු උඩැක්කිය"

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | පෙර | බු | දු | ම | ඟු | ල | ට | - | - | - | - |
| + | ගෙනා | - | උ | ඩැක් | - | කි | ය | - | - | - | - |
| + | ඒ | බු | දු | ම | ඟු | ල | ට | - | - | - | - |
| + | ගැසු | - | උ | ඩැක් | - | කි | ය | - | - | - | - |

(iii). උදාර වන්නමේ අඩව්ව හෝ තුන්තාලයේ ඉරට්ටිය හෝ යක්පද මාත්‍රයේ කලාසම ප්‍රස්තාර කරන්න.

උදාර වන්නම අඩව්ව.

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ත | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ද |
| තත් | කඩ | ජිත් | කඩ | කඩ | තක | ත | ක | ට | ත | කු | ද |
| ග | ත | කු | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ද |
| තත් | - | තත් | කඩ | කඩ | තක | ජිත් | - | ජිත් | කඩ | කඩ | තක |
| තොං | - | තොං | කඩ | කඩ | තක | නං | | | | | |

තුන්තාලයේ ඉරට්ටිය

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රෙ | ග | තත් | - | රෙ | ග | තත් | - | රෙ | ග | තත් | - | දොම් | - | දොම් | - |
| රෙ | ග | ත | ගත් | දිරි | කිට | ග | ත | රෙ | ග | තත් | - | දොම් | | | |

යක්පද මාත්‍රයේ කලාසම

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තහර් - | රූ | | - | දං | - | ග | ත | දිරි | කිට | තරි | කිට | ග | ති | ග | ත |
| තහර්- | දත් | | - | තහර් - | | ද | ක | දොං - | | ත | ග | ති | ත | ග | ත |
| ග | ති | ග | ත | දිරි | කිට | තරි | කිට | තා | - | ජී | - | මිත් | - | තත් | - |
| ග | ති | ග | ත | තරි | කිට | කුං | දත් | තා | | | | | | | |

*නිවැරදි විභාගවලට වෙන් කිරීමහා සංකේත භාවිතයට - ලකුණු 02*
*නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 06*
*මුළු ලකුණු 08*

2. "ශාන්තිකර්මවල ගායනය,වාදනය,පමණක් නොව එහි සැරසිලි මෙන්ම රංගවස්ත්‍රාභරණ ද සුසංයෝගවේ."

(1). පහත් මඩුවේ හෝ දෙවොල් මඩුවේ නර්තනාංග **දෙකක්** හඳුන්වා දී ඒ පිළිබඳ විමසුමක් කරන්න.

<u>පහත් මඩුවේ නර්තන අංග.</u>

. දෙවොල්,තෙල්මෙ,හත්පදපෙළපාලි,මල්මඩුපුරය,යහන් දැක්ම.

<u>දෙවොල් මඩුවේ නර්තන අංග</u>

. දෙවොල්, තෙල්මෙ, වාහල, පත්තිනි, හත්පද පෙළපාලි, යහන් දැක්ම

- දෙවොල් නර්තනය.
  - *ගායනය සහිත බව*
  - දෙවොල් දෙවියන් ලංකාවට ගොඩබැසීම පිළිබඳ එමගින් විද්‍යාමාන වන බව
  - ඊට ආවේනික ඇඳුම් කට්ටලයකින් සැරසී නර්තනය කරන බව
  - දෙවොල් පද ඇතුළත් සාමූහික නර්තන අංගයක් බව

- තෙල්මෙ නර්තනය
  - පහතරට ශාස්ත්‍රීය නර්තන අංගයක් /සබරගමු හැන්දෑ සමයමේ ඉදිරිපත් කරන නර්තන අංගයක් බව
  - සාමූහික නර්තන අංගයක් බව
  - පහතරට ප්‍රධාන ඇඳුම් කට්ටලයෙන් /සබරගමු නර්තනයට ආවේනික ඇඳුම් කට්ටලයෙන් සැරසී නර්තනය සිදු කරන බව
  - තෙල්මෙ තටුව රඟ බිම මැද තබා නර්තනය කරන බව
  - පහතරට සම්ප්‍රදායේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරන බව

***නර්තන අංග දෙකක් හඳුන්වා විමසුමක් කර ඇත්නම්... ලකුණු 06***

(11) කොහොඹා කංකාරියේ ගායනය සහිත ගායනය රහිත නර්තන අංගය බැගින් ගෙන ඒවායේ විශේෂතා විග්‍රහ කරන්න.

<u>ගායනය සහිත නර්තන අංග.</u>

අස්නේ, කොහොඹා හැල්ල, මඩුපුරය, දාන පහ , කථා පහ.

<u>ගායනය රහිත නර්තන අංග.</u>

යක්ඇනුම,ආවැන්දුම,හත් පදය,දුනුමාලප්පුව,යක්තුන්පදය,කෝල්පාඩුව

ගායනය සහිත නර්තන අංග.

- කුවේනි අස්නේ.
  - කතා පුවත හා සම්බන්ධ ගායනා අන්තර් ගත බව
  - ශාස්ත්‍රීය නර්තන අංගයක් බව
  - විශේෂ බෙර පද, තාල', සාම්ප්‍රදායික මාත්‍රා, කස්තිරම් ඇති බව,
  - කංකාරියට සහභාගිවන සියලුම යක්දෙස්සන් සහභාගි වන බව
  - ජ්‍යෝෂ්ඨත්වය අනුව ශිල්පීන්ට කුසලතා දැක්විය හැකි බව

- කොහොඹා හෑල්ල
  - o කොහොඹා දෙවියන්ගේ උපත් කථාව අන්තර්ගත ගායනා ඇතුළත් නර්තනයක් බව
  - o සංකීර්ණ බෙර පද ,තාල රූප ඇති බව
  - o ශාස්ත්‍රීය පදනමක් මත නර්තනය ගොඩනැගී ඇති බව

- මඩුපුරය
  - o ගායනා භාවිත ශාස්ත්‍රීය නර්තන අංගයක් බව
  - o පත්තිනි ,වීරමුණ්ඩ දෙවියන් වෙනුවෙන් ගායනා කරන බව
  - o අතිශය චමත්කාර ජනක නර්තන අංගයක් බව
  - o විවිධ තාල රූප අනුව නර්තනය කරන බව
  - o පොල් මල භාවිතයේ සුවිශේෂතා ඇති බව

ගායනය රහිත නර්තන අංග.

- යක් ඇනුම
  - o සියලුම ශිල්පින් ඉදිරිපත් කරනු ලබන ප්‍රථම රංගනය බව
  - o විවිධ තාල රූප හා ශාස්ත්‍රීය බෙර පද වලට අනුව නර්තනය කරන බව
  - o පොල් පන්දම ඊ ගස අතට ගන්නා බව
  - o එක් එක් ශිල්පීය දක්ෂතා නර්තනයේ යෙදෙන අවස්ථාවක් බව

- ආවැන්දුම
  - o ප්‍රධාන වට්ටම් වලින් සමන්විත වන බව
  - o වට්ටම් කොටස් නම් කර විස්තර කර තිබේ නම්
  - o දොගර ජිංත වට්ටම අනුරූපණ මාධ්‍යයෙන් ඉදිරිපත් කෙරෙන බව
  - o එම නර්තනයේදි ආංගික හා සාත්වික අභින භාවිත වන බව

- හත්පද
  - o හත් පද නම් කොට හඳුන්වා දිය යුතු බව
  - o නර්තනයේ ශාස්ත්‍රීය ලක්ෂණ ඇති බව
  - o බෙර පද හා තාල විශේෂතා ඇති බව

*ගායනය සහිත, රහිත නර්තන අංගය බැගින් තෝරා ගෙන ඒවායේ විශේෂතා විග්‍රහ කර ඇත්නම් ...... (3 + 3) ලකුණු 06*

(111). සන්නි යකුමේ එන සන්නි හා පාළි රංගන වල රංගවස්ත්‍රාභරණ පිළිබඳ ඇගයිමක් කරන්න.

- සන්නි හා පාළි රංගනවල භාවිතා කරන රංගවස්ත්‍රාභරණ නම් කර තිබීම
- යොදා ගෙන අමු ද්‍රව්‍ය පිළිබඳ විස්තර කර ඇත්නම්
- වෙස් මුහුණුවල විවිධතා හා වර්ණ භාවිතය
- රංගවස්ත්‍රාභරණවල වර්ණ භාවිතය හා අලංකරණයේ සුවිශේෂ ලක්ෂණ දක්වා තිබීම

*ඉහත කරුණු ඇසුරින් ඇගයිමක් කර ඇත්නම්... ලකුණු 08*

3. (1). බලි ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර එහි ගායනාවල සුවිශේෂතා පිරික්සන්න.

අරමුණු

- බලියාගය පුද්ගලයෙක් හෝ පවුලක් වෙනුවෙන් පවත්වන බව
- පොදුවේ රටට සෙත් පතා නවග්‍රහයින්ගෙන් පිහිට පතා බලි ශාන්තිකර්ම පවත්වන අවස්ථා ඇතිබව
- ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැතිව පවත්වන බව
- පොදුවේ නවග්‍රහයින්ගෙන් ඇතිවන අපල උපද්‍රව දුරුකර ගැනීම සඳහා පවත්වනු ලබන බව
  උදා: ඇස්වහ, කටවහ ,හෝවහ ,භූත විකාර ,තුන්දොස් කිපීම, හදි හූනියම් වැදීම යනාදිය සඳහා පවත්වනු ලබන බව

ගායනාවල සුවිශේෂතා

- ග්‍රහපංති , කඩතුරා , බලි මඩුපුරය , ඇඹුම් කවි ,හිං හතරේ කවි, සිරසපාද කවි මෙහිදි ගැයෙන ගායනා බව
- කවි ගායනාවල බුදුගුණ අන්තර්ගත වන බව
  උදා: පිරිත් හූය කවි , සිරසපාද කවි
- විවිධ තාල හා නාදමාලා, කවි ගායනාවල අන්තර්ගත වි ඇති බව
- අත්මිණිය හා දැල් වූ පන්දමක් හෝ පුවක්මල් කිනිත්තක් දෑතට ගන්නා බව
- ප්‍රාදේශිය වශයෙන් යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ භාවිත කරන බව
- සුවිශේෂ බලි ගායනා මගින් ආතුර මනස සුවපත් වන බව

*අරමුණු පැහැදිලි කිරිමට ලකුණු 03*
*ගායනාවල සුවිශේෂතා දැක්වා ඇත්නම් ලකුණු 03*
*මුළු ලකුණු 06*

(11). නර්තන කලාවේ ආරම්භයට ප්‍රාථමික මානව සමාජ පසුබිම බලපෑ ආකාරය පෙන්වා දෙන්න.

- මිනිසා සාමූහිකව ජීවත්වීම ආරම්භ වූ අවස්ථාවේ සිටම චලනය ප්‍රකාශන මාධ්‍යක් ලෙස යොදා ගත් බව
- ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මිනිසා ආහාර සපයා ගත් පසු ප්‍රීතිය ප්‍රකාශ කිරිම සඳහා අංගචලන යොදා ගත් බව
- නව ශිලා අවධියේ කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත් මිනිසා ස්වභාවධර්මයෙන් විවිධ වස්තූන් දේවත්වයට ආරෝපණය කර ඒ සඳහා පූජෝපහාර පැවැත්වීම නර්තනය ආරම්භයට හේතු වූ බව

*විස්තර කර ඇත්නම් ලකුණු 06*

(111). ආගමික හා සමාජීය අවශ්‍යතා සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිතා කර ඇති ආකාරය පෙන්වා දෙන්න.

ආගමික අවස්ථා

- පෙරහැර/ තේවා හේවිසි/ පිංකම්/පෝය හේවිසි/දළදා පූජා/ස්ථූප පූජා/පූජා හේවිසි වැනි අවස්ථා

සමාජීය අවස්ථා

- අණ බෙර/රණබෙර/මළ බෙර/වද බෙර/මගුල් බෙර/තූර්ය වාදන අවස්ථා/ප්‍රසංග සහ උත්සව අවස්ථා/ප්‍රසංග අවස්ථා/ශාන්තිකර්මයන්හි අන්තර්ගත වාදන අවස්ථා

***විස්තර කර ඇත්නම් ලකුණු 08***

## *11 කොටස*

4. දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට විවිධ ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයන කිරීම වැදගත් වේ.

(1). අනුරාධපුර යුගයේ පැවති බෞද්ධාගමික පුද පූජා නර්තන කලාව පෝෂණය වීමට දායක වූ ආකාරය සාධක 3ක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

- රුවන්වැලිසෑය ධාතු නිධානෝත්සවයට දුටුගැමුණු රජතුමා දහසය දහසක නළඟනන් සමඟ සහභාගි වූ බව
- ක්‍රි.පූ.3 සියවසේ ථූපාරාමය ධාතු නිදන් කිරීම සඳහා ධාතූන් වහන්සේලා ඇතෙකු පිට වැඩම කරවූ බවත්,අනේකතාලාවචරයින් විසින් තම ඇතා පිරිවරන ලද බවත් සමන්තපාසාදිකාවේ සඳහන් වූ බව
- දුටුගැමුණු රජ මහාසෑය ධාතු නිධන් උත්සවයේ දී පූජා කළ වස්තු අතර නිළි රූපයක්ද වූ වග

***බෞද්ධාගමික පුද පූජා ඇසුරින් සාධක ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 06***

(11). කවිකාර මඩුව,නැටුම් ඉලංගම,පෙරහර පැවැත්වීම සඳහා මහනුවර යුගයේ රජවරුන්ගෙන් සිදු වූ සේවාව කරුණු 3ක් යටතේ විග්‍රහ කරන්න.

- **කවිකාර මඩුව**
  - මහනුවර රාජ සභාවට අයත් නැටුම්,ගැයුම්,වැයුම් වලින් සැදුම් ලත් ස්ථානයක් බව
  - මුහන්දිරම් නිළමේවරයකුගේ භාරකත්වය යටතේ පාලනය වූ කවීන් බෝහෝ දෙනෙක් සහභාගි වූ බව
  - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සමය එහි ස්වර්ණමය යුගය බව
  - ,රම්මොලවක අධිකාරම් විසින් රජුගේ ගුණ වර්ණනා කර ශෘංගාලංකාරය වැනි ප්‍රබන්ධ කළ බව
- **නැටුම් ඉලංගම**
  - නැටුම් ඉලංගම ආයතනයක් වශයෙන් පැවති බව
  - මලබාර් සම්ප්‍රදායට අනුව සැකසුණු ස්ත්‍රීන්ගෙන් සමන්විත වූ බව

- පෙරහර
  - පෙරහර පැවැත්වීමේ දී මහනුවර රජවරුන්ගේ සිදු වූ සේවාව හා සතර දේවාල පිළිබඳ තොරතුරු

*ලියා ඇත්නම් ලකුණු 06*

(111). 20 සියවසේ නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙකුගේ නර්තන නිර්මාණ සහ කලා කෘති පිළිබඳ අගයන්න.

විෂය නිර්දේශගත දෙදෙනෙකු නම් කර ඔවුන්ගේ නිර්මාණ සහ කලා කෘති පිළිබඳ ලියා ඇත්නම්

*ලකුණු 08*

5. (1). සම්ප්‍රදායික කවිවල හා ජන කවිවල සමාන අසමානතා පෙන්වා දෙන්න.

- සමානතා

  - සාම්ප්‍රදායික කවි හා ජන කවි රචනා වීමට හේතු වූ පසුබිමක් මත කවි ගොඩ නැඟී ඇති බව
  - විවිධ තාල රූපවලට අනුව ගායනා කළ හැකි බව
  - ආසාතාත්මක හා අනාසාතාත්මක ලක්ෂණ ඇති බව

- අසමානතා

  - භාවිතා වන තාල රූපවල සාම්ප්‍රදායික හා ජන වශයෙන් අසමානතා ඇති බව
  - භාවිතා වන නාදමාලාවල අසමානතා ඇති බව
  - සාම්ප්‍රදායික ගායන ශාන්තිකර්ම හා බැඳී ඇති බව
  - කවි සඳහා යොදා ගන්නා භාෂාවේ අසමානතා ඇති බව

*කරුණු ලියා ඇත්නම් ලකුණු 06*

(11). රබන් කවියක් හෝ පන්තේරු කවියක් හෝ ගෙන එහි අන්තර්ගත තොරතුරු විමසුමට ලක් කරන්න.

- රබන්/පන්තේරු කවිය තෝරා ගැනීමේ නිවැරදි බව හා එම කවියට අදාළව එහි අන්තර්ගත තොරතුරු විමසුමට ලක් කර ඇත්නම්

*ලකුණු 06*

(111). කෝලම් හෝ සොකරි නාටක වලින් එක් චරිතය බැගින් තෝරා ගෙන එම චරිතවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ තුලනාත්මක විග්‍රයක් කරන්න.

- කෝලම් හෝ සොකරි චරිත 2ක් තෝරා ගැනීමට

*ලකුණු 02*

- බීමත්කම,සුරාව,පවුල් සංස්ථාව තුල ඇති නොසන්සුන්කම,අල්ලස,රාජකාරිය පැහැර හැරීම
- තමාට හිමි වගකීම් හා වගවීම් තේරුම් නොගන්නා බව
- අව්‍යාජත්වය චරිත තුළ දක්නට ඇති බව
- චරිත ඔවුන්ගේ ක්‍රියා කලාපයන් හාස්‍යට හා උපහාසයට ලක් කරන බව
- කාන්තාවන් තුළ ඇති ධෛර්ය සම්පන්න බව
- දුරදිග බලා තීරණ ගැනීම,ඉවසිලිවන්ත බව,තැනට සුදුසු ලෙස ක්‍රියා කිරීම, වැනි ගුණාංග වලින් යුත් චරිත ඉස්මතු වීම

*තෝරා ගත් චරිත ඇසුරින් තුලනාත්මක විග්‍රයක් කර ඇත්නම් ලකුණු 08*

# 111 කොටස

6. පහත සඳහන් වගුවේ (අ),(ආ) සහ(ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1). (අ) කොටසේ සඳහන් කථකලි නර්තන සම්ප්‍රදායේ රංගවස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.

- ඥෝරී
  - රංග ශිල්පියාගේ යටිකය සඳහා භාවිතා කරන්නක් බව
  - යටිකයේ තනි වර්ණයෙන් යුත් අලංකාර සැරසිලි සහිතව පිම්බුණු ස්වාභාවය පිළිබඳ තොරතුරු ලියා ඇත්නම්

*රංගවස්ත්‍රාභරණය නම් කිරීමට ලකුණු 02*
*විස්තර කර ඇත්නම් ලකුණු 04*
*මුළු ලකුණු 06.*

(11). (ආ) කොටසේ සඳහන් භරත නාට්‍යම් නර්තන අංගය තෝරා එම නර්තනයේ විශේෂතා නම් කරන්න.

නර්තන අංගය - තිල්ලානා

- නෘත්ත ගණයට අයත් ඉතා සංකීර්ණ නර්තනාංගයක් බව
- මෙහි තාලය හා ලය ප්‍රධාන වන බව
- ගායනයට අනුව නර්තනය කෙරෙන පද ඊට උපයෝගි කෙරෙන සංගීතය සුවිශේෂ බව
- අංග ,ප්‍රත්‍යාංග, උපාංග භාවිතා කරමින් ඉතා කෙටි භාව ප්‍රකාශනයක් ඇති බව
- අවසාන භාගයේදී රංගානුකරණය ඉතා සරලව යෙදෙන බව

*යනාදි කරුණු විස්තර කර ඇත්නම් ලකුණු 06*

(111). (ඉ). කොටසේ සඳහන් අය අතුරෙන් ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රගමනයට දායක වූ ප්‍රවීන කලාකරුවා නම් කර ඔහුගෙන් ඉටු වූ සේවාව පිළිබඳ ඇගයීමක් කරන්න.

- රවීන්ද්‍රනාත් තාගෝර් තුමා.
  - තාගෝර් තුමා පැමිණීමෙන් පසු මුද්‍රා නාට්‍ය කලාව ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇති බව
  - ඔහු සමඟ පැමිණි ඉන්දීය නර්තන ශිල්පීන් කණ්ඩායම ශාප්මෝචන් මුද්‍රා නාට්‍යය
  - ඉදිරිපත් කළ බව
  - දේශීය නර්තන ශිල්පීන් ද මුද්‍රා නාට්‍යය නිර්මාණකරණයට යොමු කර ඇති බව
  - ශ්‍රීපාලි ආයතනය ආරම්භ කිරීමට දායක වීම හා භාරතීය නර්තන ශිල්පීන්ගේ සේවය එම ආයතනයට ලබා දීම
  - දේශීය නර්තන ශිල්පීන්ට භාරතීය නර්තනය හැදෑරීමට ශිෂ්‍යවත්ව ලබා දීම
  - දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට දායකවීම.

*නම් කිරීමට ලකුණු 02*
*ඇගයීමට ලකුණු 06*
*මුළු ලකුණු 08*

7. (1). දේශීය ජන ජීවිතය ඉස්මතු කිරීම සඳහා කරදිය මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරු විසින් කරන ලද උත්සහය එම මුද්‍රා නාට්‍යය ඇසුරින් විග්‍රහ කරන්න.

- o මුද්‍රා නාට්‍යය මාධ්‍ය හා තේමාව අතර ගැලපීම
- o ගැමි ධීවර කතා පුවතක් පාදක කරගෙන ඇති බව
- o ජන ජීවිතය ඉස්මතු වන පරිදි ගායනා යොදා ගෙන ඇති බව
- o යොදා ගෙන ඇති රංගවස්ත්‍රාභරණ, උපකරණ හා පසුතල නිර්මාණවල උචිත බව

*ආදී කරුණු ඇසුරින් විග්‍රහයක් කර ඇත්නම් ලකුණු 06*

(ii) ප්‍රංශයේ බැලේ නාට්‍ය ප්‍රවර්ධනය වූ ආකාරය විමසුමට ලක් කරන්න.

- o ප්‍රංශයේ 2 හෙන්රි රජු සහ බිසව වන කැතරින් ඩී මෙඩිසි සමඟ දියුණු කළ බව
- o xiv වන ලුවී රජු බැලේ නර්තනය ඉගෙනීම සඳහා Royal Accedamic dela Dance යනුවෙන් ආයතනයක් ආරම්භ කළ බව

*ආදී කරුණු විස්තර කර ඇත්නම් ලකුණු 06*

(iii) මාර්තා ග්‍රැහැම්, ඉසඩෝරා ඩන්කන්, ජීන් ජෝර්ජ් නොර්වැර්, මයිකල් ෆෝකින් යන ශිල්පීන් අතුරින්
දෙදෙනෙකු පිළිබඳ අගයන්න.

මාර්තා ග්‍රැහැම්

- o උපත 1894 පෙන්සිල්වේනියාවේ දීය. වයස අවුරුදු 14 දී නර්තනයට පිවිසි බව.
- o ඇමරිකානු නව නර්තන දක්ෂ නැටුම් ශිල්පිනියක් බව.
- o 1926 දී ඇයගේ ප්‍රථම නර්තන ප්‍රසංගය නිව්යෝක්වල පවත්වා ඇති බව
- o ඇය ඉදිරිපත් කළ නිර්මාණ අනුකරණයෙන් තොර නිදහස් ශෛලියකින් යුක්ත බව
- o සරල රංග වස්ත්‍ර වේදිකාවට හඳුන්වා දී ඇති බව
- o ඇයගේ නර්තන සමාගම " මාර්තා ග්‍රැහැම්" (Dance Company) නමින් හඳුන්වා නර්තන කණ්ඩායම් සමඟ විදෙස් සංචාරයේ යෙදී ඇති බව
- o නූතන නර්තන කලාවේ පුරෝගාමී කෙනෙකු වූ බව

ඉසඩෝරා ඩන්කන්,

- o නර්තනය පිළිබඳ ලැබූ අත්දැකීම් ඇසුර කර ගනිමින් නර්තනය අනෙකුත් ප්‍රජාව සඳහා බෙදා හැරීමට කටයුතු කළ බව
- o 1899 ලන්ඩන් හා පැරිස් නගරයන්හි සංචාරයේ යෙදෙමින් නර්තනය කුසලතා වර්ධනය කර ගත් බව
- o බැලේ නර්තනය ඉගෙනීම සඳහා කැලිෆෝනියාවේ බැලේ නර්තන පාසලට ඇතුළත් වූ බව
- o සම්ප්‍රදායික බැලේ නර්තනය ප්‍රගුණ කළ මුත් බැලරීනා කෙනෙකුවීමට නොහැකි වූ බව
- o භාව ප්‍රකාශනයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ කලාවක් පිළිබඳ අවධානය යොමු කර ඇති බව
- o ලෝකයේ විවිධ රටවල ප්‍රසංග ඉදිරිපත් කර ඇති බව

ජීන් ජෝර්ජ් නොර්වැර්

- නෝර්වැර් 1727 අප්‍රියෙල් 29 දින පැරීසියේ උපන් අතර ප්‍රවීණතම නර්තන ශිල්පියා වූ බව
- 1761 දී රෝයල් බැලේ නාට්‍ය කණ්ඩායමට එක් වූ බව
- බැලේ නාට්‍ය නවීකරණය කර ශිල්පීය මට්ටමට ගෙන ආ බව
- ඔහු විසින් රචිත Leters on Dancing and Ballet යන කෘතියෙන් ශාරීරික චලන හා ප්‍රකාශ කිරීමේ කලාව පිළිබඳ කරුණු දක්වා ඇති බව
- නට්ක්‍රැකර්,රොමොන්ඩා ,රෝමියෝ ජුලියට් නම් බැලේ නාට්‍ය නිෂ්පාදනය කර ඇති බව
- බැලේ නර්තනයේ මුත්තා යන විරුදාවලියෙන් හඳුන්වන බව
- මෙතුමාගේ උපන් දිනය යුනෙස්කෝ සංවිධානය මඟින් ලෝක නර්තනය දිනය වශයෙන් නම්කර ඇති බව
- පැරණි රංග ශෛලීන් හා රංගවස්ත්‍රාභරණ වෙනස් කොට සැහැල්ලු ඇඳුම්පැළඳුම් භාවිත කොට නව මුහුණුවරක් ලබා දුන් බව

මයිකල් ෆෝර්කින්

- රුසියානු බැලේ ශිල්පියෙකු හා නර්තන රචකයෙක් වූ බව
- ඉතා දක්ෂ නර්තන ශිල්පියෙක් මෙන්ම නර්තනය පිළිබඳ ගවේෂකයකු වූ මොහු බැලේ නාට්‍ය නිෂ්පාදනය කිරීමේ ක්‍රම විධි ගෙන හැර දැක්වූ බව
- ලා සිල්ෆීඩ්ස්, ෆයර් බර්ඩ්/ බ්ලූ බර්ඩ්, පෙට්රුෂ්කා ඔහු විසින් රංග රචනය (choreographi) නිර්මාණය කළ බව
- මියැදෙන හංසයා ඔහුගේ නිර්මාණ කෘතියක් වූ අතර ඇනා පැව්ලෝවා වෙනුවෙන්ම නිර්මාණය කළ බව
- මොහු ජීන් ජෝර්ජ් නෝර්වැර් ගේ අනුගාමිකයෙක් වූ බව
- බැලේ නාට්‍යයේ පියා ලෙස හඳුන්වන බව

## iv. කොටස

8. අද්‍යතන නර්තනයේ ප්‍රාසංගික බව මතු කිරීමට භාරතීය මෙන්ම බටහිර සංගීතයේ උපයෝගිතාවය වඩාත් ප්‍රබල වී තිබේ.

(1) අද්‍යතන ප්‍රසංග නර්තනය සඳහා යොදා ගන්නා සංචලනවල ඖචිත්‍ය බව විග්‍රහ කරන්න.

- නර්තන නිර්මාණයේ දී භාරතීය හා බටහිර නෘත්ත ලක්ෂණ වැඩි වශයෙන් සංචලන සඳහා යොදා ගෙන ඇති බව
- දේශීයත්වයට වඩා විදේශීය සංචලන අනුකරණය කොට ඉදිරිපත් කරන බව
- සංගීත සංදර්ශනවල දී ගායකයා යටපත් කර සංගීතයට අනුකූලව නර්තන ඉදිරිපත් කරන බව

*කරුණු දක්වා විස්තර කර ඇත්නම්. ලකුණු 06*

(11) ගීත නර්තන නිර්මාණකරණයට සංගීතයෙන් ලැබෙන පිටිවහල විග්‍රහ කරන්න

- නර්තන නිර්මාණයේදී ගීත රචනාවට වඩා සංගීතයට ප්‍රධානත්වයක් ලබා දෙන බව
- සංගීතයේ රිද්ම රටාවන්ට අනුව විවිධ චලන නිර්මාණය කර ගත හැකි බව
- ගීත ගායනයේදී සංගීතයේ වේග රිද්ම නර්තන නිර්මාණකරණයට බලපාන බව
- සංගීත වාද්‍ය භාණ්ඩවල රිද්ම හා තාල රටාවන්ගේ ධ්වනි ගුණයේ ලක්ෂණ නර්තනයට බලපාන බව

*ඉහත කරුණු දක්වා විස්තර කර ඇත්නම් ලකුණු 06*

(111) ප්‍රාසංගික නර්තනයේ රංගවස්ත්‍රාභරණ භාවිතය පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ විචාරයක් කරන්න

- සාම්ප්‍රදායික ලක්ෂණ
  - ප්‍රාසංගික ඉදිරිපත් කිරීමක දී සාම්ප්‍රදායික නර්තනයක රංගවස්ත්‍රාභරණවල අනන්‍යතා ලක්ෂණ ගිලිහී ඇති බව
- නිර්මාණාත්මක ලක්ෂණ
  - ප්‍රාසංගික නිර්මාණයක් කිරීමේදී පෙරදිග රටවල රංගවස්ත්‍රාභරණ අනුකරණය කර ඇති බව
- බටහිර ආභාෂය
  - බටහිර බැලේ නර්තනවල දුහුල් , කෙටි සහ දිග රංගවස්ත්‍රාභරණ අනුකරණය කර ඇති බව
- භාරතීය ආභාෂය
  - භාරතීය රංගවස්ත්‍රාභරණවල වර්ණ සහ ආභරණ අනුකරණය කර ඇති බව

*ප්‍රධාන කරුණු 4 යටතේ විස්තර තිබේ නම් ලකුණු 08*

9.

(i) රංග රචනය හා චිත්‍ර සම්පිණ්ඩනය අතර සහ සම්බන්ධතාවය විස්තර කරන්න.

- සමබරතාවය ගොඩනැගීම.
- රිද්ම රටා හා මෝස්තර
- සම්බන්ධතා
- හැඩතල
- අවකාශ භාවිතය ..............................

*පිළිබඳව විස්තර කර ඇත්නම් ලකුණු 06*

(ii) රූපවාහිනිය මගින් ඉදිරිපත් කෙරෙන නර්තන වැඩ සටහන්,රසඥතා වර්ධනයට කෙසේ බලපාන්නේදැයි .විචාරය කරන්න.

- නර්තන වැඩ සටහන් හඳුනා ගෙන ඇති බව
- නර්තන නිර්මාණවල ස්වභාවය හා ඖචිත්‍ය බව
- සංගීතය, ගීතය, වාද්‍ය භාණ්ඩ සංකලන යොදා ගෙන ඇති බව
- පසුතල නිර්මාණ, වේදිකා ආලෝක වර්ණවත් කෙරෙන බව
- රංග වස්ත්‍රාභරණවල ඖචිත්‍ය බව

*රසඥතා වර්ධනයට ඇති දායකත්වය විස්තර කර ඇත්නම් ලකුණු 06*

(111) සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා වන පරිදි රංග ආභරණ ආකෘතියක් නිර්මාණය කර ගන්නා ආකාරය විමසන්න

- අදාළ සාම්ප්‍රදායික ලක්ෂණ අනුව තෝරා ගෙන ඇති බව
- අදාළ ආකෘතියේ දළ සැකැස්මක් ඇඳ ගැනීම හා පරිමාණ ලක්ෂණ සකස් කර ගෙන ඇති බව
- අවශ්‍ය අමුද්‍රව්‍ය තෝරා ගෙන ඇත්නම්.
- රේඛා, මෝස්තර,හැඩතල,වර්ණ ගැළපීම,හා සමස්ත නිමාව පිළිබඳ අවබෝධය ඇති බව

*විස්තර කර ඇත්නම් ලකුණු 08*